00116

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව
5 වන මට්ටම

**LLU5709** පරිපාලන නීතිය

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II - 2022/2023

කාලය - පැය 1

---

දිනය : 2023 දෙසැම්බර් 01 වේලාව: ප.ව. 01.30 - ප.ව. 02.30

---

ප්‍රශ්න ගණන - දෙකයි (02)

එක් ප්‍රශ්නයකට (01) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. (අ) රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරිය (RSEA) යනු 2008 අංක 45 දරන රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරි පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. පුනර්ජනනීය බලශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා බලපත්‍ර නිකුත් කිරීම ඇතුළුව ඇතැම් බලතල රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරිය වෙත පවරා ඇත. එම පනත යටතේම ස්ථාපිත කර ඇති උපදේශක කමිටුවේ නිර්දේශ මත එකී ව්‍යාපෘති සඳහා බලපත්‍ර ප්‍රදානය කිරීමට පනතේ 15 වන වගන්තිය මඟින් රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ලබා දේ.
පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා KP Solar Power පුද්ගලික සමාගම විසින් රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරිය වෙත අයදුම්පතක් යොමු කර ඇත. කෙසේ නමුත්, රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරිය විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කළ අතර පසුව සොයා ගනු ලැබුවේ KP Solar Power පුද්ගලික සමාගම වෙත බලපත්‍රය නිකුත් නොකරන ලෙසට අධ්‍යක්ෂ ජනරාල්වරයාට රුසිටානියාවේ මහජන උපයෝගිතා කොමිසම උපදෙස් ලබා දී ඇති බවයි.

රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරියෙහි තීරණය අධිකරණයෙහි අභියෝගයට ලක් කිරීමට KP Solar Power පුද්ගලික සමාගම අපේක්ෂා කරයි.

(i) විනිශ්චිත නඩු තීන්දු සහ අදාළ පරිපාලන නීති මූලධර්ම ඇසුරින් ඔවුන්ට උපදෙස් දෙන්න.

( ලකුණු 09 )

(ii) රුසිටානියා තිරසාර බලශක්ති අධිකාරියට ඔබේ උපදෙසට එරෙහිව යම් විත්තිවාචකයක් ඉදිරිපත් කළ හැකි යැයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

( ලකුණු 03 )

(ආ) අභිමතය වූ කලී හුදෙක් පරිපාලන අධිකාරීන්ට ඔවුන් පුරුදුව සිටින සිතැඟි දේ කිරීමට ලබා දුන් බලයක් නොවේ. ඔවුන් කළ යුතු දේ හැර ඔවුන්ට කැමති දේ සිදු කිරීමට අභිමතය ක්‍රියාත්මක නොකළ යුතුය.

පරිපාලන අධිකාරීන් විසින් අභිමතය අයුතු ලෙස භාවිතය පාලනය කිරීම සඳහා අධිකරණ විසින් සංවර්ධනය කර ඇති පදනම් ඇසුරින් උක්ත ප්‍රකාශය පරීක්ෂා කරන්න. ( ලකුණු 08 )

2. "ස්වභාවික යුක්තිය පිළිබඳ රීති මගින් පරිපාලන ක්‍රියා සඳහා වන නිදහස සීමා කරනවා සේම ඒවාට අනුගත වීම සඳහා ද යම් කාලයක් හා මුදලක් වැය වේ. නමුත්... සාධාරණත්වය තහවුරු කිරීමට හා අයුක්තීන් අවම කිරීමට ඒවා අත්‍යවශ්‍ය රීතීන් වේ, එම නිසා, ස්වභාවික යුක්තිය පිළිබඳ රීති කාර්යක්ෂමතාවයට බාධා කිරීමට වඩා එය ප්‍රවර්ධනය කරනු ලබන බවට පැවසිය හැක. එසේ වුවද, ඒවා ගැටුම් ඇති කර ගැනීමට අධිකරණ මගින් ඉඩ ලබා නොදෙන අතර ඕනෑම අවස්ථාවක යහ පරිපාලනය මගින් නියම කරන ප්‍රමිතීන් සමග අනුගත කරනු ලැබේ, ඒවා පුරවැසියන්ට පමණක් නොව නිලධාරීන්ටද ආරක්ෂණයක් වන බවට සැලකිය යුතුය."

*McNabb* v. *United States,* 318 US 332 (1943)

උක්ත ප්‍රකාශය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු තීන්දු නීතිය මගින් සනාථ කළ යුතුයි.

(අ) *audi alteram partem* රීතිය මගින් කෙතරම් දුරකට යුක්තිය පැහැර හැරීම වළක්වනු ලැබේද?

( ලකුණු 10 )

(ආ) පරිපාලන විනිශ්චය තුළ ශ්‍රී ලංකාවේ අධිකරණ විසින් පක්ෂපාතීත්වයට එරෙහි රීතිය තහවුරු කර ඇත්තේ කෙසේ දැයි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

( ලකුණු 10 )

---හිමිකම් ඇවිරිණි---